Living the LOTUS
Buddhism in Everyday Life
4
2019
VOL. 163

## Founder's Essay

# මනුෂ්‍යයන්ගේ දුර්වලතා හඳුනන පුද්ගලයන්

ජේසු තුමන්ට ඉතාම දක්ෂ ධර්ම දූතයන් 12 දෙනෙකු සිටියහ. නමුත්, ජේසු තුමන් සිර භාරයට පත්වූ පසු 'අපි නම් මොහුව හඳුනන්නේ නැතැයි' පවසමින් තම ගුරුවරයාව, එම ධර්ම දූතයන් විසින් ප්‍රතික්ෂේප කරන ලදී. කුරුසයට තබා ඇණ ගැසීමෙන් ජේසු තුමා මිය ගියද, නැවත උත්ථානයෙන් පසු තම ධර්ම දූතයන්ගේ පාවාදීම ගැන දැනගත්තද දොස් පැවරුවේ නැත. ඒ ආකාරයේ ජේසු තුමන්ගේ හැසිරීමෙන් තම ජීවිත වෙනස් කරගත් ධර්ම දූතයන්, පසු කාලීනව තම ජීවිතයද කැප කරමින් ධර්ම ව්‍යාප්ත කළ නිසායි මේ දක්වා ජේසු තුමන්ගේ ඉගැන්වීම් පවතින්නේ.

ජේසු තුමා විසින් මනුෂ්‍යයන් කොපමණ දුර්වල පිරිසක්ද යන වග වටහා ගෙන, ඔවුනට සමාව දෙමින්, උණුසුම් ආකාරයට කටයුතු කළ කෙනෙකි. තමන්ගේ දුර්වලතා හා අඩුපාඩු හොඳින් දැනගෙන, ඒ සෑම දෙයක්ම සමාව දී භාර ගන්නා පුද්ගලයෙකු හා හමු වීම තුලින් මනුෂ්‍යයන්ගේ ජීවිත අංශක 180 කින්ම වෙනස්වන්නේ 'කිසිම පසුතැවීමක් නොමැතිව, මේ පුද්ගලයාට මාගේ සියළුම දේ භාර කරනවා' යන හැඟීමෙනි.

බෞද්ධයන් වන අපගේ සෑම දෙයක්ම භාරගෙන ඒ ආකාරයට කටයුතු කරනුයේ බුදුන් වහන්සේය. බුදුන් වහන්සේගේ හදවත ඒ ආකාරයෙන්ම බද්ධ කරගෙන, ස්වරූප 33 කින් අපගේ පිහිටට සිටින්නේ අවලෝකිතේෂ්වර බෝධිසත්වයන් වහන්සේය. එම මෛත්‍රිය කරුණාවට වෙළී, අපද ඒ ආකාරයට අවලෝකිතේෂ්වර බෝධිසත්වයන් මෙන් විය යුතුය ලෙස කැපවෙන්නේ නම්, නොපසුබටව තම ජීවිතය කැපකරමින් ධර්ම ව්‍යාප්ත කරන පිරිසක් ටිකෙන් ටික බිහිවේ.

*Kaiso zuikan* 9 පි. 146-147

Living the Lotus
Vol. 163 (April 2019)

Senior Editor: Koichi Saito
Editor: Kensuke Suzuki
Copy Editor: P.A.D. Somapala, G.N. Ruklanthi, Sahan Chamara

*Living the Lotus* is published monthly by Rissho Kosei-kai International,
Fumon Media Center, 2-7-1 Wada,
Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124
FAX: +81-3-5341-1224
Email: living.the.lotus.rk-international@kosei-kai.or.jp

රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදී නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මූලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජීවිතයට බද්ධ කර ගෙන, සාමකාමී ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි. වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මූලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සෑම ධර්ම ව්‍යප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලී සිටියි.

Living the Lotus-Buddhism in Everyday Life (සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙදා දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.) යන තේමාව තුල, එදිනෙදා ජීවිතයට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ කියැවීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවු ලස්සන නෙලුම් මලක් සේ තම ජීවිතය සමෘධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මගින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවු සාමාජික සාමාජිකාවන් එදිනෙදා දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවු අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදාහැරීම සිදු කරනු ලැබේ.

*President's Message*

# සුවඳවත් වූ මද පවනක් වැනි මිනිසුන්



නිචිකෝ නිවානෝ තුමා
ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය

## හදවතින් හමනා සුවඳවත් වූ පවන

ගීත රචක රෙන්තරෝ තකි මහතා විසින් ලියන ලද 'හනා' (මල) නම් ගීතය තුලින් ජපානයේ මනස්කාන්ත වසන්ත සමය වර්ණනා කරයි. 'වසන්ත සමයේ මන වඩනා දවසක්' ලෙසින් ආරම්භ වන මෙම ගීතය, ඔබ සියළුදෙනා හොඳින් දන්නවා යැයි සිතමි. එහි සඳහන් වන්නේ වසන්ත කාලයේ පිපෙන සකුරා මල ගැන වුවත්, සකුරා මල් පිපෙන්නට පෙර ඇප්‍රිකොට් මල් (උමේ), ඩැෆ්නි මල් හා මැග්නෝලියා (සපු වර්ගයේ) මල් පිපීමෙන් ඇති වන ඉම්හිරි සුගන්ධය නිසා බොහෝ දෙනාට වසන්තය උදාවීමේ සතුට දැනෙන්නේය.

ඒ ආකාරයේ සතුට දනවන ප්‍රකාශයක් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ, 1 වන පරිච්ඡේදය වන නිදාන කථාවෙහි සඳහන් වේ, 'චන්දන සුගන්ධය දසත පතුරවමින්, කිමැයි මේ සිදුවන අසිරිය නම්'. මෙහි අදහස නිර්මාතෘ නික්යෝ නිවානෝ තුමා විසින් සරළ ලෙසින් විවරණය කරන්නේ, 'බුදුන් වහන්සේගේ සුගන්ධමත් මදපවන, මනුෂ්‍යයන්ගේ හදවතට ඇතුළු වූ විට ඇතිවන ප්‍රබල උද්දාමයයි'.

අපි බුදු දහම දැන ඇඳිනගත් අය ලෙස, නොකඩවා දහමට සවන් දෙමින්, ඉගෙන ගනිමින් හා පිළිපැදීම තුලින් බොහෝ දේ අවබෝධ කර ගැනීමට හැකිවේ. පෙර දිනවල අකමැතිව සිටි පුද්ගලයන් හා දේවල් ගැන කෘතවේදීත්වයක් ඇති කර ගැනීමටත්, මේ මොහොත දක්වා සතුට ප්‍රමෝදය ලෙස සිතා සිටි දේ හුදෙක්ම තම ආත්මාර්ථකාමීත්වය මුල් වූ බව වැටහී, ජීවන මඟ වෙනස් වේ.

එලෙසින් සත්‍ය වශයෙන්ම වැදගත් දේ අවබෝධ කර ගෙන, දුක් වේදනා වලින් මිදී සතුට ළඟා කර ගත් විට 'ධර්මය තුලින් දුකින් මිදීමට හැකිවූවා' යැයි ඉබේම අපගේ මුවින් පිටවේ. එය නිර්මාතෘ තුමා 'ඉමහත් ප්‍රීතියක් උද්දීපනය' කර ගැනීම ලෙස ප්‍රකාශ කර ඇත. එවැනි අවස්ථාවලදී එම තැනැත්තන් 'අන් අයටද සතුටක් ගෙන ආකාරයට' කටයුතු කරයි. සතුට යනුවෙන් ලිවීමේදි භාවිතා කරන කන්ජි අක්ෂරය යෙහි (悦) අරුත නම්, 'හදවතේ තිබෙන කහට ඉවත්කර ගැනීමේ සතුට' වේ.

අපට බුදුන් වහන්සේව දැසින් දැක බලා ගැනීමට හැකි නොවේ. නමුදු, දයිසෙයිදෝව ඇතුලත හා ධර්මය තුල බුදුන් වහන්සේගේ මහා කරුණාව හැගෙනවා සේම, ධර්මය ප්‍රායෝගිකව පුහුණුවේ යෙදවීම තුලින් ජීවත්වීමේ සතුටට දෑස් විවර කරගත් අයගේ සෙප්පෝවන් අසන විට, අපටද ඉමහත් සතුටක් දැනෙයි. එය 'චන්දන සුගන්ධය දසත පතුරවමින්, කිමැයි මේ සිදුවන අසිරිය නම්' ලෙස සූත්‍ර පාඨයේ වැකිය මෙන්, ධර්මයේ විශිෂ්ඨත්වය හදවතින් හමා පැමිණේ. එය බුදුන් වහන්සේ වැඩ සිටි සමයෙහි සිටම අද දක්වාද වෙනස් වී නැත.

# අපි සියළු දෙනාම 'පින් ඇත්තෝ' වෙමු

එචිගෝ පෙදෙසේ (වර්තමාන නීගතා ප්‍රාන්තයේ) වාසය කළ රියෝකන් නම් සෙන් හිමි, මෙම 'චන්දන සුගන්ධය දසත පතුරවමින්, කිමැයි මේ සිදුවන අසිරිය නම්' සූත්‍ර පාඨය දැන ගෙනදෝ, 'ජීවිතය පුරාම සුගන්ධවත් වෙමි' යනුවෙන් තම ආදර්ශ පාඨය පවත්වා ගත්හ. එය 'ජීවිත කාලය පුරාම, සුගන්ධිමත් මද පවනක් බඳු පුද්ගලයෙකු වී, මිනිසුන්ගේ හදවත් උණුසුමින් වෙළාගනිමින්, සාමයත් සතුටත් ලබාදෙන ආකාරයට ජීවත්වීමට ඇති කැමැත්තයි.'

එසේම ධම්ම පදයේ, 'නැත මල් සුවඳ උඩු සුළඟෙහි ගැවසෙන්නේ - තුවරලා සඳුන් හර නැත දුරට විහිදෙන්නේ, තිසරණ සිල් ගුණැති යහපත් මිනිසුන්නේ - ගතිගුණ ලොවෙහි පැතිරෙයි මිහිරි සුවඳක් විලසින්නේ' සේ සඳහන් ලෙස, අන් අයට ''සතුටක්' ගෙනදෙන්නට පින' අවශ්‍යය. නිතරම 'මට නම් පිනක් නැහැ', 'අරයට නම් පිනක් තියෙනවා' ලෙස පවසනවා වුවත්, 'පින' තම ශරීරයට බද්ධ කර ගැනීමට, ආධ්‍යාත්මික දියුණුව හා යහගුණ එක් රැස් කිරීම හේතු විය හැකියි.

නමුදු මට නම් එය, එසේමයි ලෙස පැවසිය නොහැකිය. අපි මේ මොහොතේ, මේ ලොවෙහි ජීව ශක්තිය තුලින් ජීවිතය ලබාගෙන ඇත. එනම් ස්වභාව ධර්මයේ පින, අපගේ මුතුන් මිත්තන්ගේ හා දෙමාපියන්ගේ පිනද අප ලබා ගෙන, දැනටමත් විපුල වූ පින් වලින් යුතු වේ. එබැවින් අප කළ යුතු වන්නේ, දැනටමත් තමාතුල තිබෙන 'පින' අවබෝධ කර ගැනීමයි. එම පින අවබෝධය කර ගෙන, වර්ධනය කර ගන්නේ නම්, ඕනෑම කෙනෙකුට මිහිරි සුවඳ රැගෙන යා හැකි, 'පින් ඇත්තෝ' විය හැකිය.

එහිදී 'කෘතවේදී වීම' ඉතා වැදගත්ය. සෑම සියළු දෙයක් කෙරෙහිම කෘතවේදීත්වය අමතක නොකරන අවංක නිහතමානි පුද්ගලයන් වෙතට, මිනිසුන් ඉබේම ආකර්ෂණය වේ. එසේම ඔවුන් තුල තිබෙන දීප්තිමත්, කාරුණික, උණුසුම් ක්‍රියාවන් හා වදන් තුලින්, ඔවුන්ගේ පින වඩාත් සුවඳවත් වේ. අන් අය ගැන සිතමින්, මෘදු මොලොක් බවින් කටයුතු කිරීමෙන්, ඔවුන් තුලින් හමන ධර්මයේ සුවඳ අන්‍යයන්ට සුවදායි බවක් ලබා දේ.

මෙම අප්‍රේල් මාසයේ ජපානය පුරා බුදුන් වහන්සේගේ උප්පත්තිය සමරනවා මෙන්ම, හෙයිසෙයි යුගය නිමාවන මාසයද වන්නේය. එය සාමය උදාකිරීමේ ක්‍රියාවලිය දියාරුවක් බවක් පත් නොවන්නට, හදවත නව ආකාරයට වෙනස් කර ගැනීමට ලැබුණ අවස්ථාවක් යැයි මම විශ්වාස කරමි. ධර්මය නමැති සුවඳවත් වූ මද පවන විහිදුවාලන ආකාරයේ ජීවන ගමනක් යාමේ අවශ්‍යතාව ඉදිරියට තව තවත් වැදගත් වන්නේය.

From *Kosei*, April 2019.



# සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ

## සාරාංශය හා වැදගත් කරුණු

## සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය
## 7 වන පරිච්ඡේදය, ඉන්ද්‍රජාලිකව මවන ලද නගරයේ උපමාව (1)

'උපමා කතාව', 'විශ්වාසය හා අවබෝධය' හා 'ඖෂධ පැළෑටි උපමාව' ආදි පරිච්ඡේද වලදී ප්‍රධාන වශයෙන් බුදුන් වහන්සේ, ධර්මයේ ස්වරූපය හා ක්‍රියාකාරිත්වය පිළිබඳ උපමා කතා තුලින් පැහැදිලි කරදුනි. එහෙත් තවමත් අවබෝධයක් නොලත් පිරිස සඳහා මෙම 'ඉන්ද්‍රජාලිකව මවන ලද නගරයේ උපමාවේ' 7 වන පරිච්ඡේදය සිට 'ආනන්ද තෙරුණ්ට විවරණ දීම'යන 8 වන පරිච්ඡේදය දක්වා, පෙර භවයේ සැබැඳියාවන් මූලික කරගෙන දේශනා කරයි.

'ඉන්ද්‍රජාලිකව මවන ලද නගරයේ උපමාව' තුලින් ධර්ම ශ්‍රාවකයන්ගේ වර්තමාන ධර්ම පුහුණුව ප්‍රශංසා කිරීමටත්, අනාගතයේදී ධර්මාවබෝධය ලබා ගත හැකි බවට ස්ථිර විශ්වාසයත් ඇති කිරීම සඳහා, ඈත අතීතයේ සිට බුදුන් වහන්සේ හා සමඟ තිබෙනාවු බැඳීම දේශනා කරන ලදී. එහිදි, ධර්මයේ වෙනසක් සිදු නොවන බව, සෑම සියළු සත්වයෙකුම බුද්ධ ශක්තියෙන් යුතු බව, එබැවින් සෑම කෙනෙකුම කවදා හෝ සත්‍යාවබෝධ තුලින් බුදු බව සාක්ෂාත් කරන බව කියාදේ.

### මහාභිඥානාභිභූ තථාගතයන් වහන්සේගේ ඉතිහාස කථාව

අපට සිතා ගැනීමටවත් නොහැකි ඈත අතීතයේදී, මහාභිඥානාභිභූ තථාගතයන් නම් බුදුන් වහන්සේ නමක් වැඩ සිටි බව සඳහන් කරමින් මෙම පරිච්ඡේදය ආරම්භ වේ. එම බුදුන් වහන්සේ ගිහි කළ රාජ කුමාරයෙකු වූ අතර, දරුවන් 16 දෙනෙකු සිටියහ. වැඩිමහළු පුතා ප්‍රඥකූඨ නම් විය. ප්‍රඥකූඨ හා ඔහුගේ බාල සොහොයුරන්, තමන් කුඩා කලම නිවසින් නික්ම ගිය පියා ඈත රටක දීර්ඝ කාලයක් ධර්ම පුහුණුවෙන් පසු ධර්මාවබෝධය ලබාගත් බව අසා, තමනුත් පියාණන්සේම ධර්ම පුහුණුවේ යෙදෙමු යැයි අධිෂ්ඨාන කරගත් ඔවුන්ව, කඳුළු සලමින් මව හා මිත්තනිය පිටත් කර යැවූහ. එසේම මුත්තනුවන් වන, මහාභිඥානාභිභූ තථාගතයන් වහන්සේගේ පියාණන් වන ධර්මිෂ්ඨ චක්‍රවර්ති රජතුමාද විශාල මැති ඇමතිවරුන් හා පරිවාර සෙනගද සමග මහාභිඥානාභිභූ තථාගතයන් වහන්සේ බැහැ දැකීමට ගියහ.

එහිදී පිය රජතුමා, 'බුදුන් වහන්සේ මීට පෙර අප සමඟ සාමාන්‍ය මනුෂ්‍යයෙක් ලෙස ජීවිතය ගත කලා වුවත්, සියළු සත්වයන්ව දුකින් මුදවා ගැනීම සඳහා ඉතා දිර්ඝ කාලයක් වැය කරමින් ධර්ම පුහුණුවේ යෙදී, බුදු බව සාක්ෂාත් කර ගත්තා. ඒ අනුව අපටත් බුදු බවට පත්වීමේ හැකියාව තිබෙන බව අවබෝධ කර ගත්තා. ඉන් එහා සතුටක් නැත. එබැවින් අප වෙනුවෙන් ධර්මය දේශනා කරනු මැනවි' ලෙස පැවසූහ. දරුවන් 16 දෙනාද ඉතා ඕනෑකමින් එසේ ඉල්ලීම් කලහ.

එවිට මහාභිඥානාභිභූ බුදුන් වහන්සේ, එහි රැස්වූ විශාල පිරිසට 'මෙම බෝධිසත්ව සාමණේර කුමාරවරු 16 දෙනා, ඈත අතීතයේ සිටම විශාල බුදුවරු පිරිසකට වන්දනා කරමින් පැමිණ, එහි පුහුණුව ලබමින් නිතරම සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය දේශනා කරමින් විශාල පිරිසක් ධර්ම මාර්ගයට ගත්හ. එම පිරිසගේ ජීවිතය එක් වතාවකට පමණක් සීමා නොවේ, තමාට ධර්මය කියාදෙන පිරිස සමඟ නැවත නැවත එකට ඉපදී, එම ධර්මය අසා හොඳින් අවබෝධ කර ගත්හ' ලෙස දේශනා කරන ලදී.

### සහලෝකයේ බුදුන් වහන්සේ, ශාක්‍යමුණි බුදුන්ය

ඉහත ආකාරයේ අතීත කථාවන් පැවසූ බුදුන් වහන්සේ, නැවතත් හඬ අවධිකරමින්, 'ඔබලාට ඉතා වැදගත් දෙයක් පවසන බැවින් හොඳින් සවන්දෙන්න. මෙම බෝධිසත්ව කුමාරවරු 16 දෙනා, පසු කාලිනව බුදුවරු බවට පත්ව වර්තමානයේද දස දිශාවන්හි ධර්මය දේශනා කරමින් සිටියි' ලෙස පවසා, එම බුදුන් වහන්සේලාගේ නම් හා ධර්මය දේශනා කරන්නාවු දේශයන් පැවසූහ. එයිනුත් 16 වැනියා ශාක්‍යමුණි බුදුන් වන තමා බවත්, මෙලොවෙහි සත්‍යාවබෝධය ලබා ධර්මය දේශනා කරමින් සිටින බවත් වදාලහ. ඈත අතීතයේදී සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයට අනුකූලව ධර්මය දේශනා කල ශ්‍රාවකයන්, වර්තමානයේද අනාගතයේද තම ශ්‍රාවකයන් බව පැහැදිලි කලහ.

ඉන් පසු මෙසේද වදාලහ.

'මනුෂ්‍ය ස්වරූපයෙන් මෙලොවට පහළ වූ බුදුන්



වහන්සේ හැමදටම සිටිනවා නොවේ. තමා අවබෝධ කල ධර්මය දේශන කර, මෙලොවින් ඈත්ව පිරිණිවනට ළඟා වේ. ඒ වන විට විශාල පිරිසක් ධර්මය කෙරෙහි විශ්වාසය හා අවබෝධය වඩවා ගෙන, සෑම මනුෂ්‍යයෙකුගේම සමානාත්මතාව හොඳින් අවබෝධ කරගෙන, හදවත නියමාකාරයෙන් ශක්තිමත් කරගෙන සිටියි නම්, අතීතයේ මෙන්ම වර්තමානයේද සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය දේශනා කරමින් සිටිමි'.

'ලෝක ධාතුවෙහි සත්‍ය වූ නිර්වාණය ලබා ගත හැකි මාර්ග 2 ක් නැත. ඇත්තේ එකම එක මාර්ගයකි. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය පමණි. තථාගතයන් වහන්සේගේ උපාය කෞෂල්‍යයෙන් සියළු සත්වයන්ගේ ස්වරූපය හා ධාරණ ශක්තිය නිර්ණය කර ගනියි. එමෙන්ම පංච කාමයන්හි ඇලී, තමා විසින්ම දුක නිර්මාණය කරගෙන සිටින මිනිසුන්ද සිටින බැවින්, එම පුද්ගලයන් වෙනුවෙන් සන්සුන් මනසක් ඇති කර ගැනීමට මඟ පෙන්වයි. එම කරුණ උපමා කථාවක් මගින් පැහැදිලි කරන්නම්' ලෙස පවසමින්, 4 වන උපමා කතාව වන 'ඉන්ද්‍රජාලිකව මවන ලද නගරයේ උපමාව' පැහැදිලි කලහ. එය පහත පරිදිය.

## ඉන්ද්‍රජාලිකව මවන ලද නගරයේ උපමාව

කඳු හෙල්වලින් යුතු මිනිස් වාසයකින් තොර අත් හැර දැමූ දුර්ග මාර්ගයක් ඇත්තේ යැයි උප කල්පනය කරන්න. මෙම මාර්ගය අවසන් වන ස්ථානයේ ඉතා දුර්ලභ වටිනා මහා සම්පත් ඇති බැවින් ඒ වෙත යාමට ඉතා විශාල වූ පිරිසකට අවශ්‍ය වන්නේ ය. එ මෙන්ම ඉතා ප්‍රඥාවන්ත මෙම මාර්ගයේ දුෂ්කරතා මෙන්ම, අවසානය ගැනද මැනවින් දත් නායක මාර්ගෝපදේශයකු ද එම පිරිසෙහි සිටියා.

මේ පිරිස තුල කකුල් වල ආබාධ ඇති අයද, ඉවසීමක් නැති අයද සිට වෙහෙසට පත්ව නායකයා අමතා 'නායකයාණෙනි අප අතිශයින්ම වෙහෙසටත් බියටත් පත්ව සිටින්නෙමු. තව දුරටත් ඉදිරියට යන්නට අප අසමත් වෙමු. මාර්ගයෙහි අවසානයක් ද නොපෙනේ එහෙයින් අප ආපසු හැරී යන්නට රුචි වන්නෙමු.' සේ කියා සිටියහ.

මෙම නායකයා, අවස්ථාවට හා ස්ථානයට අනුකූලව උපාය කෞෂල්‍යයන් තුලින් උපදෙස් ලබා දීමට දැනිමක් තිබුණි. එබැවින් හදවතින් 'මේ අසීරුතාව තව ටිකකි, විශාල සම්පත් ප්‍රමාණයක් ලැබෙන ස්ථානයක් අතහැර ආපසු සිතන්නේ මන්ද' ලෙස සිතා, උපාය කෞෂල්‍යය තුලින් මෙම දුර්ග මාර්ගයේ සමීපයට වෙන්නට විසිතුරු මාළිගාවන්ගෙන් හෙබි මහා නුවරක් මැවීය. අනතුරුව එම පිරිස අමතා මෙසේ කියා සිටියේ ය. 'මිනිසුනි බිය නොවන්න ඔබ ආපසු නො හැරිය යුතුය. බලන්න අර ඔබ ඉදිරියේ දිස්වන මහා නගරය, එහි ඔබට නවාතැන් ගෙන ගිමන් නිවා ගත හැකිය, ඔබ රුචි පරිද්දෙන් එහි ගත කළ හැකිය. එම නගරයට ඇතුළුව සැණෙකින් ඔබ



සැනසෙනු ඇත' ලෙස පැවසූහ.

එයින් ඉතා සතුටට පත් පිරිස මාළිගයට ඇතුළුව විවේක ගත්හ. මද වේලාවකින් පසු නායකයා විසින් එම පිරිස වෙහෙස නිවා සැනහෙන බවත් දැක තමන් විසින් නිමැවූ එම සිහින නගරය අතුරුදහන් කර මෙසේ ඔවුන් ඇමතූහ. 'අප දැන් ගමන් ඇරඹිය යුතුය සම්පත් නුවර නොදුරුය. මෙම විශ්මිත නගරය මම විසින් මැවූයේ ඔබලාට විවේක ගැනීමට උපාය කෞෂල්‍යයක් ලෙසිනි'.

ඒ ආකාරයට එක් වරක් ප්‍රශංසා කර, නැවතත් වටිනා සම්පත් ඇති ස්ථානය වෙත ගමන් ආරම්භ කලහ.

මේ මස සිට නික්යෝ නිවානෝ තුමා විසින් රචිත
『සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ සාරාංශය හා වැදගත් කරුණු』

කෝසේයි මුද්‍රණ ආයතනයේ ප්‍රකාශනයකි. 2016, P74-P80

## Director's Column

# චන්දන සුගන්ධය දසත පතුරුවමින්, කිමැයි මේ සිදුවන අසිරිය නම්

සකුරා මල් පිබිදෙමින් වසන්ත කාලය උදාවුනි. එසේම අප්‍රේල් මාසය බෞද්ධයෝ වන අපට වැදගත් වන්නේ, ජපානය පුරා බුදුන් වහන්සේගේ උපත සමරන නිසාය.

නිචිකෝ සෙන්සෙයිගේ මාසික පණිවුඩයේ සදහන් ආකාරයට, මල් වල සුවඳින් මනුෂ්‍යයන් වෙතට වසන්ත කාලයේ ආශ්වාදය රැගෙන එන්නා සේ, අපිද සුවදවත් වූ සුළඟක් මුදාහරින පිරිසක් බවට පත්වී, මනුෂ්‍යයන්ගේ හදවත් සනහාලන ලෙස කටයුතු කිරීමේ වැදගත්කම පෙන්වාදී තිබුනි.

ඒ ආකාරයට 'පින් ඇති පුද්ගලයන්' බවට පත්වීමට වැදගත් වන්නේ, කෘතවේදීත්වය අමතක නොකරන අවංක නිහතමානී හදවතයි.

බුදු දහමේ සුවදවත් සිහිලස රැගෙන යන ජීවිතයක් අපේක්ෂා කරන වත්මන් කාලයේ, දීප්තිමත් කාරුණික උණුසුම් ආකල්ප හා වදන් තුලින් අන්‍යයන් ගැන සිතන ශාන්ත බවින් කටයුතු කරන පුද්ගලයෙකු බවට පත්වීමට අපිද කටයුතු කරමු.

රි.කෝ.කා. අන්තර්ජාතික මූලස්ථාන ප්‍රධානී
කෝයිචි සයිතෝ මහතා





We welcome comments on our newsletter Living the Lotus: living.the.lotus.rk-international@kosei-kai.or.jp

# Rissho Kosei-kai: A Global Buddhist Movememt




**Rissho Kosei-kai International**
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo, Japan
*Tel:* 81-3-5341-1124 *Fax:* 81-3-5341-1224
*e-mail:* living.the.lotus.rk-international@kosei-kai.or.jp

**Rissho Kosei-kai International of North America (RKINA)**
2707 East First Street, Suite #1, Los Angeles, CA 90033, U.S.A
*Tel:* 1-323-262-4430 *Fax:* 1-323-262-4437
*e-mail:* info@rkina.org http://www.rkina.org

**Branch under RKINA**

**Rissho Kosei-kai of Seattle's Buddhist Learning Center**
28621 Pacific Highway South, Federal Way, WA 98003 U.S.A.
*Tel:* 1-253-945-0024 *Fax:* 1-253-945-0261
*e-mail:* rkseattlewashington@gmail.com
http://buddhistlearningcenter.org/

**Rissho Kosei-kai Buddhist Center of San Antonio**
6083 Babcock Road, San Antonio, TX 78240, U.S.A.
P.O. Box 692148, San Antonio, TX78269, U.S.A
*Tel:* 1-210-561-7991 *Fax:* 1-210-696-7745
*e-mail:* dharmasanantonio@gmail.com
http://www.rkina.org/sanantonio.html

**Rissho Kosei-kai of Tampa Bay**
2470 Nursery Road, Clearwater, FL 33764, U.S.A.
*Tel:* (727) 560-2927 *e-mail:* rktampabay@yahoo.com
http://www.buddhismtampabay.org/

**Rissho Kosei-kai of Vancouver**

**Rissho Kosei-kai Buddhist Church of Hawaii**
2280 Auhuhu Street, Pearl City, HI 96782, U.S.A.
*Tel:* 1-808-455-3212 *Fax:* 1-808-455-4633
*e-mail:* info@rkhawaii.org http://www.rkhawaii.org

**Rissho Kosei-kai Maui Dharma Center**
1817 Nani Street, Wailuku, HI 96793, U.S.A.
*Tel:* 1-808-242-6175 *Fax:* 1-808-244-4625

**Rissho Kosei-kai Kona Dharma Center**
73-4592 Mamalahoa Highway, Kailua-Kona, HI 96740 U.S.A.
*Tel:* 1-808-325-0015 *Fax:* 1-808-333-5537

**Rissho Kosei-kai Buddhist Center of Los Angeles**
2707 East First Street, Los Angeles, CA 90033, U.S.A.
*Tel:* 1-323-269-4741 *Fax:* 1-323-269-4567
*e-mail:* rk-la@sbcglobal.net http://www.rkina.org/losangeles.html

**Rissho Kosei-kai Buddhist Center of Arizona**
**Rissho Kosei-kai Buddhist Center of Colorado**
**Rissho Kosei-kai Buddhist Center of San Diego**
**Rissho Kosei-kai Buddhist Center of Las Vegas**
**Rissho Kosei-kai Buddhist Center of Dallas**

**Rissho Kosei-kai of San Francisco**
1031 Valencia Way, Pacifica, CA 94044, U.S.A.
*Tel:* 1-650-359-6951 *Fax:* 1-650-359-6437
*e-mail:* info@rksf.org http://www.rksf.org

**Rissho Kosei-kai of Sacramento**
**Rissho Kosei-kai of San Jose**

**Rissho Kosei-kai of New York**
320 East 39th Street, New York, NY 10016 U.S.A.
*Tel:* 1-212-867-5677 *Fax:* 1-212-697-6499
*e-mail:* rkny39@gmail.com http://rk-ny.org/

**Rissho Kosei-kai of Chicago**
1 West Euclid Ave., Mt. Prospect, IL 60056 U.S.A.
*Tel :* 1-773-842-5654 *e-mail:* murakami4838@aol.com
http://rkchi.org/

**Rissho Kosei-kai of Fort Myers**
http://www.rkftmyersbuddhism.org/

**Rissho Kosei-kai Dharma Center of Oklahoma**
2745 N.W. 40th Street, Oklahoma City, OK 73112 U.S.A.
*Tel:* 1-405-943-5030 *Fax:* 1-405-943-5303
*e-mail:* rkokdc@gmail.com http://www.rkok-dharmacenter.org

**Rissho Kosei-kai Dharma Center of Denver**
1255 Galapago Street, #809 Denver, CO 80204 U.S.A.
*Tel:* 1-303-446-0792

**Rissho Kosei-kai Dharma Center of Dayton**
425 Patterson Road, Dayton, OH 45419 U.S.A.
http://www.rkina-dayton.com/

**Risho Kossei-kai do Brasil**
Rua Dr. José Estefno 40, Vila Mariana, São Paulo-SP,
CEP 04116-060 Brasil
*Tel:* 55-11-5549-4446 / 55-11-5573-8377 *Fax:* 55-11-5549-4304
*e-mail:* risho@terra.com.br http://www.rkk.org.br

**Risho Kossei-kai de Mogi das Cruzes**
Av. Ipiranga 1575-Ap 1, Mogi das Cruzes-SP,
CEP 08730-000 Brasil
*Tel:* 55-11-5549-4446 / 55-11-5573-8377

**Rissho Kosei-kai of Taipei**
4F, No. 10 Hengyang Road, Jhongjheng District,
Taipei City 100, Taiwan
*Tel:* 886-2-2381-1632 *Fax:* 886-2-2331-3433
http://kosei-kai.blogspot.com/

**Rissho Kosei-kai of Tainan**
No. 45, Chongming 23rd Street, East District,
Tainan City 701, Taiwan
*Tel:* 886-6-289-1478 *Fax:* 886-6-289-1488

**Korean Rissho Kosei-kai**
6-3, 8 gil Hannamdaero Yongsan gu, Seoul, 04420,
Republic of Korea
*Tel:* 82-2-796-5571 *Fax:* 82-2-796-1696
*e-mail:* krkk1125@hotmail.com

**Korean Rissho Kosei-kai of Busan**
3F, 174 Suyoung ro, Nam gu, Busan, 48460, Republic of Korea
*Tel:* 82-51-643-5571 *Fax:* 82-51-643-5572

**International Buddhist Congregation (IBC)**
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo, Japan
*Tel:* 81-3-5341-1230 *Fax:* 81-3-5341-1224
*e-mail:* ibcrk@kosei-kai.or.jp http://www.ibc-rk.org/

**Branches under the Headquarters**

**Rissho Kosei-kai of Hong Kong**
Flat D, 5/F, Kiu Hing Mansion, 14 King’s Road,
North Point, Hong Kong, Republic of China

**Rissho Kosei-kai of Ulaanbaatar**
15F Express tower, Peace avenue, khoroo-1, Chingeltei district,
Ulaanbaatar 15160, Mongolia
*Tel:* 976-70006960 *e-mail:* rkkmongolia@yahoo.co.jp

**Rissho Kosei-kai of Sakhalin**
4 Gruzinski Alley, Yuzhno-Sakhalinsk
693005, Russian Federation
*Tel & Fax:* 7-4242-77-05-14

**Rissho Kosei-kai Friends in Shanghai**

**Rissho Kosei-kai of South Asia Division**
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang
Bangkok 10310, Thailand
*Tel:* 66-2-716-8141 *Fax:* 66-2-716-8218

**Rissho Kosei-kai International of South Asia (RKISA)**
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang
Bangkok 10310, Thailand
*Tel:* 66-2-716-8141 *Fax:* 66-2-716-8218
*e-mail:* thairissho@csloxinfo.com

**Branches under the South Asia Division**

**Rissho Kosei-kai of Delhi**
77 Basement D.D.A. Site No. 1, New Rajinder Nagar,
New Delhi 110060, India

**Rissho Kosei-kai of Kolkata**
E-243 B. P. Township, P. O. Panchasayar, Kolkata 700094,
West Bengal, India

**Rissho Kosei-kai of Kolkata North**
AE/D/12 Arjunpur East, Teghoria, Kolkata 700059,
West Bengal, India

**Rissho Kosei-kai of Bodhgaya**
Ambedkar Nagar, West Police Line Road
Rumpur, Gaya-823001, Bihar, India

**Rissho Kosei-kai of Kathmandu**
Ward No. 3, Jhamsilhel, Sancepa-1, Lalitpur, Kathmandu,
Nepal

**Rissho Kosei-kai of Phnom Penh**
#201E2, St 128, Sangkat Mittapheap, Khan 7 Makara,
Phnom Penh, Cambodia

**Rissho Kosei-kai of Patna**
**Rissho Kosei-kai of Singapore**

**Thai Rissho Friendship Foundation**
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang
Bangkok 10310, Thailand
*Tel:* 66-2-716-8141 *Fax:* 66-2-716-8218
*e-mail:* info.thairissho@gmail.com

**Rissho Kosei-kai of Bangladesh**
85/A Chanmari Road, Lalkhan Bazar, Chittagong, Bangladesh
*Tel & Fax:* 880-31-626575

**Rissho Kosei-kai of Dhaka**
House#408/8, Road#7(West), D.O.H.S Baridhara,
Dhaka Cant.-1206, Bangladesh
*Tel & Fax:* 880-2-8413855

**Rissho Kosei-kai of Mayani**
Mayani(Barua Para), Post Office: Abutorab, Police Station:
Mirshari, District: Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Patiya**
Patiya, sadar, Patiya, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Domdama**
Domdama, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Cox’s Bazar**
Ume Burmese Market, Main Road Teck Para, Cox’sbazar,
Bangladesh

**Rissho Kosei-kai of Satbaria**
Satbaria, Hajirpara, Chandanish, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Laksham**
Dupchar (West Para), Bhora Jatgat pur, Laksham, Comilla,
Bangladesh

**Rissho Kosei-kai of Raozan**
West Raozan, Ramjan Ali Hat, Raozan, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Chendirpuni**
Chendirpuni, Adhunagor, Lohagara, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Ramu**

**Rissho Kosei Dhamma Foundation, Sri Lanka**
No. 628-A, Station Road, Hunupitiya, Wattala, Sri Lanka
*Tel:* 94-11-2982406 *Fax:* 94-11-2982405

**Rissho Kosei-kai of Habarana**
151, Damulla Road, Habarana, Sri Lanka

**Rissho Kosei-kai of Polonnaruwa**

**Branches under the Headquarters**

**Rissho Kosei-kai di Roma**
Via Torino, 29-00184 Roma, Italia
*Tel & Fax:* 39-06-48913949 *e-mail:* roma@rk-euro.org

**Rissho Kosei-kai of the UK**
**Rissho Kosei-kai of Venezia**
**Rissho Kosei-kai of Paris**